# විෂය - චිත්‍ර

කාර්ය පත්‍රිකාව **10 ශ්‍රේණිය**

**2021 ජනවාරි 02 වන සතිය**

---

## 1.1.2. නිදහසේ සැරිසරන වන සතුන් (කාලච්ඡේද 02)

- ඉහත තේමාව යටතේ චිත්‍රය ඇඳ වර්ණ කිරීම කළ යුතුයි.
- විශේෂයෙන් රූපවාහිනී "ඩිස්කවරි" වැනි වන සතුන්ගේ ජීවන චර්යාවන් ගවේෂණය කර රූගත කරන ලද වාර්තා වැඩ සටහන් හෝ නරඹා තිබේ නම් මෙය ඔබට වඩාත් පහසු වේවි.
- මෙහිදී නිරීක්ෂණය වඩාත් වැදගත් වේ.

  උදා : දිය බීමට පැමිණෙන මුව රංචුවක් පිළිබඳව අවධානය යොමු කරමු. මෙහිදී, සියළු මුවන් වතුර බොන්නේ නැත. කිහිප දෙනෙක් වතුර බොන තෙක් රංචුවේ අනිත් මුවන් හොඳින් අවට පරිසරය පිළිබඳ නිරීක්ෂණයෙන් පසුවෙයි. මක් නිසාද යත් ඔවුන් කුමන මොහොතක හෝ කාගේ හෝ ගොදුරක් විය හැකි නිසාවෙනි.

- එම නිසා සතුන්ගේ චර්යාවන් නිරීක්ෂණය කිරීම වඩා වැදගත් වේ. එමෙන්ම පහත දැක්වෙන සිද්ධාන්ත පිළිබඳව අවධානය යොමු කරමින් චිත්‍රය ඇඳීම හා වර්ග කිරීම කළ යුතුය.

01. තලය භාවිතය
02. තේමාවට අදාළව සත්ත්ව චර්යාවන් හා පරිසරය යොදා ගැනීම.
03. පරිමාණය
04. පර්යාවලෝකනය
05. සමබරතාවය
06. ගති ලක්ෂණ දැක්වීම.
07. තේමාවේ අර්ථය තීව්‍ර වන පරිදි වර්ණ භාවිතය
08. වර්ණ පර්යාවලෝකනය
09. ත්‍රිමාණ ලක්ෂණ භාවිතය
10. සමස්ත නිමාව